සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 12 - 2019

විභාග අංකය ....

ව්‍යාපාර අධ්‍යයනය I

කාලය පැය දෙකයි

උපදෙස්

- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. අස්පෘශ්‍ය නිෂ්පාදිතයක ඇති ලක්ෂණයක් නොවන්නේ,
1. ගබඩා කළ නොහැකි වීම.
2. සපයන්නා ගෙන් වෙන් කළ නොහැකි වීම.
3. සමජාතීය වන පරිදි නිෂ්පාදනය කළ හැකිවීම
4. භෞතික පැවැත්මක් නොමැති වීම.
5. සපයන්නා අනුව වෙනස්වීම. (...........)

02. ව්‍යාපාරයක ගති ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?
1. ලාභයෙන් අභිප්‍රේරණය වීම.
2. අවදානමක් නොතිබීම
3. උපයෝගිතා නිර්මාණය කිරීම
4. ගණුදෙනුව අඛණ්ඩව සිදු වීම.
5. ආර්ථික කටයුත්තක් වීම. (...........)

03. මුදල් භාවිතයේ ක්‍රමික විකාශනය පිළිවෙලින් දැක්වෙන්නේ,
1. ද්‍රව්‍ය භාවිතය, ලෝහ වර්ග භාවිතය, ලෝහ කාසි භාවිතය, කාසි හා නෝට්ටු භාවිතය, බැංකු මුදල් භාවිතය, විද්‍යුත් මුදල් භාවිතය.
2. ද්‍රව්‍ය භාවිතය, ලෝහ කාසි භාවිතය, ලෝහ වර්ග භාවිතය, කාසි හා නෝට්ටු භාවිතය, බැංකු මුදල් භාවිතය, විද්‍යුත් මුදල් භාවිතය,
3. ද්‍රව්‍ය භාවිතය, ලෝහ වර්ග භාවිතය, ලෝහ කාසි භාවිතය, කාසි හා නෝට්ටු භාවිතය, විද්‍යුත් මුදල් භාවිතය, බැංකු මුදල් භාවිතය.
4. ලෝහ වර්ග භාවිතය, ද්‍රව්‍ය භාවිතය, ලෝහ කාසි භාවිතය, කාසි හා නෝට්ටු භාවිතය, බැංකු මුදල් භාවිතය, විද්‍යුත් මුදල් භාවිතය
5. ලෝහ කාසි භාවිතය, ලෝහ වර්ග භාවිතය, ද්‍රව්‍ය භාවිතය, කාසි හා නෝට්ටු භාවිතය, විද්‍යුත් මුදල් භාවිතය, බැංකු මුදල් භාවිතය. (...........)

04. තෘතීය අංශයේ ව්‍යාපාරයක් නොවන්නේ කුමක් ද?
1. ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම.
2. නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීම.
3. රාජ්‍ය පරිපාලනය හා ජාතික ආරක්ෂාව
4. ඉදිකිරීම් කටයුතු
5. තොරතුරු හා සන්නිවේදන කටයුතු (...........)

05. ව්‍යාපාරයක යෙදවුවක් ලෙස සලකා බැලිය නොහැකි සාධකයක් වනුයේ,
1. කාලය 2. ප්‍රාග්ධනය 3. තොරතුරු 4. නිෂ්පාදිත 5. දැනුම (...........)

06. ව්‍යාපාර පරිසර විශ්ලේෂණයේ දී හඳුනාගත හැකි ශක්තියක් නොවන්නේ,
1. අභිප්‍රේරණය වූ සේවකයින් සිටීම.
2. ආවේනික දියුණු චර්යා ධර්ම හා පුරුදු සංවිධානමය සංස්කෘතිය තුළ පැවතීම.
3. රජය විසින් ව්‍යාපාරයට හිතකර ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
4. අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය ඉහළ වීම.
5. ප්‍රමාණාත්මක හා ගුණාත්මක සම්පත් පැවතීම. (...........)

07. සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත්, එමගින් සමාජයට ඇතිවන බලපෑම පිළිබඳවත් පෞද්ගලිකව ව්‍යාපාර වගකීම සමාජ වගකීමයි. මෙම සමාජ වගකීම පිළිබඳව නිර්වචනය ගෙන එන ලද්දේ,
1. පිලිපීනය විසිනි. 2. මාලන් බේකර් විසිනි.
3. ඇමරිකා එක්සත් ජනපදය විසිනි. 4. ලෝක ව්‍යාපාර කවුන්සිලය මගිනි.
5. නාරායන් මූර්ති විසිනි. (...........)

08. ව්‍යාපාර විසින් සමාජය වෙත ඉටු විය යුතු සමාජ වගකීමක් වන්නේ,
1. සාධාරණ ඉපයීමක් ලබාදීම. 2. හානි අවම කිරීම.
3. වෘත්තීමය ආරක්ෂාව සැලසීම. 4. මනා සේවක සම්බන්ධතා පවත්වාගෙන යාම
5. රැකියා නියුක්තියට දායකවීම. (...........)

09. තිරසර සංවර්ධනයේ ප්‍රධාන කොටසක් ලෙස සැලකිය හැක්කේ,
1. ආර්ථික තිරසර සංවර්ධනය. 2. නෛතික තිරසර සංවර්ධනය.
3. භූගෝලීය තිරසර සංවර්ධනය. 4. ගෝලීය තිරසර සංවර්ධනය
5. මූලික තිරසර සංවර්ධනය. (...........)

10. ගනුදෙනුකරු, තරඟකරුවන්, සේවකයින්, සංවිධාන සංස්කෘතික ප්‍රායෝගික බව යනාදී කරුණු,
1. ව්‍යාපාරයක සමාජ වගකීම පිළිබඳ කරුණු වේ.
2. ව්‍යාපාරයක ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සලකා බැලිය යුතු කරුණු වේ.
3. සේවක අයිතීන් සුරැකීම පිළිබඳ කරුණු වේ.
4. ව්‍යාපාරයක ගුණාත්මකභාවය පිළිබඳ කරුණු වේ.
5. ව්‍යාපාරයක තිරසර සංවර්ධනය පිළිබඳ කරුණු වේ. (...........)

11. රාජ්‍ය ආදායමට අයත් බදු වර්ග කීපයක් පහත දැක්වේ.
A පුද්ගල ආදායම් බදු B එකතු කළ අගය මත බදු C සමාගම් බදු
D රේගු බදු E රඳවා ගැනීමේ බදු F නිෂ්පාදන බදු
G ප්‍රාග්ධන ලාභ බදු
මින් ඍජු බදුවලට වලට අයත් බදු වර්ග ඇතුලත් කාණ්ඩය වන්නේ,
1. ABCD 2. ACDE 3. ABDG 4. ACFG 5. ACEG (...........)

12. රජයේ බදු නොවන ආදායම ට අයත් ආදායම් වර්ගයක් නොවන්නේ,
1. ලාභ හා ලාභාංශ 2. ගාස්තු හා අයකිරීම්. 3. ප්‍රාග්ධන ලාභ මත බදු
4. පොලී ආදායම් 5. ආදායම් බලපත්‍ර ගාස්තු (...........)

13. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට භාවිතා කරන උපකරණයක් වන්නේ,
1. ඍජු බදු 2. වක්‍ර බදු 3. පොලී අනුපාතිකය
4. රාජ්‍ය වියදම් 5. බලපත්‍ර ගාස්තු (...........)

14. පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන ආයතන අතුරින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රමිති ආයතනය ඉටු කරන කාර්යයක් නොවන්නේ මින් කුමක්ද?
   1. භාණ්ඩ සඳහා පූර්ව අපනයන පරීක්ෂාව
   2. තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය
   3. විදුලි උපකරණ වල ශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණය
   4. උපකරණ ක්‍රමාංකන සේවා
   5. පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. (...........)

15. පහත සඳහන් ඒවා අතුරෙන් පාරිභෝගික ආරක්ෂණය සැලසීම සඳහා වඩාත්ම යෝග්‍ය මාර්ගය වන්නේ,
   1. නිෂ්පාදිත සඳහා ලේබල් අනිවාර්ය කිරීම.
   2. පාරිභෝගික අධ්‍යාපනය පුළුල් කිරීම
   3. ප්‍රමිති ලාංඡන අනිවාර්ය කිරීම
   4. පාරිභෝගික ආරක්ෂණ නීති රීති පැනවීම
   5. ව්‍යාපාර සඳහා ආචාරධර්ම හඳුන්වාදීම (...........)

16. ඒක පුද්ගල ව්‍යාපාර සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. ව්‍යාපාර පහසුවෙන් ඇරඹිය හැකි වීම.
   2. වගකීම අසීමිත වීම
   3. ලාභ අලාභ තනිව භුක්ති විඳීම
   4. ව්‍යාපාරික රහස් ආරක්ෂාවීම
   5. ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්ය වීම. (...........)

17. හවුල් ව්‍යාපාර සඳහා බලපාන 1890 අංක 24 වගන්තියට ඇතුළත් නොවන ප්‍රකාශය වන්නේ,
   1. ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් යෙදූ අමතර මුදල් සඳහා 5% ක වාර්ෂික පොලියක් හිමිවේ.
   2. ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු වලට සහභාගි වීමට හැම හවුල්කරුවෙකුටම අයිතියක් ඇත.
   3. තමා යෙදූ ප්‍රාග්ධනයට අනුව ලාභාලාභ බෙදාගත යුතුයි.
   4. තමා ව්‍යාපාරයට යොදන සේවය වෙනුවෙන් වේතනයක් හිමි නොවීම.
   5. යෙදූ ප්‍රාග්ධනය වෙනුවෙන් කිසිම හවුල්කරුවකු ට පොලියක් හිමි නොවීම. (...........)

18. පහත සඳහන් වන්නේ ව්‍යාපාර සංවිධාන කීපයක් හා එයට අදාළ කරුණු කිහිපයකි. එම තීරු දෙක ගලපා නිවැරැදි පිළිතුර තෝරන්න.

<u>ව්‍යාපාර සංවිධානය</u>	<u>අදාල කරුණු</u>
A කේවල ස්වාමි ව්‍යාපාර	1. රජයේ සෘජු පාලනයට යටත්වේ.
B සීමාසහිත පොදු සමාගම්	2. පූර්ණ හෝ වැඩි අයිතියක් රජය සතුවේ.
C රාජ්‍ය සංස්ථා	3. ප්‍රාග්ධනය රැස් කිරීම, කොටස් නිකුතුවෙන් සිදුවීම.
D සමුපකාර	4. 1918 ව්‍යාපාර නාම ආඥා පනත බලපායි.
E රාජ්‍ය දෙපාර්තමේන්තුව	5. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සිදු වීම.

   1. A-2, B-1, C-4, D-5, E-1
   2. A-2, B-3, C-1, D-5, E-4
   3. A-3, B-2, C-5, D-4, E-1
   4. A-4, B-3, C-2, D-5, E-1
   5. A-4, B-3, C-2, D-1, E-5 (...........)

19. සීමිත පොදු සමාගමක ට සාපේක්ෂව සීමිත පෞද්ගලික සමාගමක දැකිය හැකි හිතකර ලක්ෂණයක් වන්නේ,
   1. වගකීම සීමිත වීම.
   2. පාලන බලය සීමිත පිරිසක් අතර රඳවා ගත හැකි වීම.
   3. නෛතික පුද්ගල බව පැවතීම.
   4. අඛණ්ඩ පැවැත්ම.
   5. වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකිවීම. (...........)

20. සමාජ සුභ සාධනය අරමුණු වූ වගකීම අසීමිත වූ අඛණ්ඩ පැවැත්මක් සහිත ව්‍යාපාර සංවිධාන අනුපිළිවෙළින් දක්වා ඇති නිවැරදි පිළිතුර වන්නේ,
1. රාජ්‍ය දෙපාර්තමේන්තු / හවුල් ව්‍යාපාර / කේවල ස්වාමි ව්‍යාපාර
2. රාජ්‍ය දෙපාර්තමේන්තු /හවුල් ව්‍යාපාර /සංස්ථාපිත සමාගම
3. රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථාපිත සමාගම්/ හවුල් ව්‍යාපාර
4. රාජ්‍ය සමාගම් / හවුල් ව්‍යාපාර / කේවල ස්වාමි ව්‍යාපාර
5. රාජ්‍ය සමාගම් / කේවල ස්වාමි ව්‍යාපාර / රාජ්‍ය දෙපාර්තමේන්තු (...........)

21. වරලත් ව්‍යාපාර අරඹීමෙන් වරලත් හිමියාට හිමිවන වාසියක් ලෙස පිළිගත හැකි ප්‍රකාශය නම්,
1. තම ව්‍යාපාරය පුළුල් වීම.
2. ණය පහසුකම් ලැබීම.
3. අඩු මිලට අමුද්‍රව්‍ය මිළට ගතහැකිවීම
4. විශාල ව්‍යාපාරයකට පිවිසීම.
5. ව්‍යාපාරය තමා විසින් ඇරඹීම අවශ්‍ය නොවීම. (...........)

22. A සමාජ තත්වය හා පිළිගැනීම ඇතිවීම.
B පූර්ණ සේවා නියුක්තිය ඇතිවීම.
C නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදාවීම.
D ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.
ඉහත දක්වා ඇති කරුණු අතරින් ව්‍යවසායකත්වය තුළින් ලබාගත හැකි වන සමාජ ප්‍රතිලාභ ඇතුළත්වන වරණය තෝරන්න.
1. A හා B 2. B හා C 3. A හා C 4. B හා D 5. A හා D (...........)

23. වෙළඳපොළින් ඇදී එන ව්‍යවසායකත්වය වඩාත් පැහැදිලිව ඉදිරිපත් කරනුයේ,
1. ගැටලුව → අවස්ථාව → අදහස → සාර්ථක ව්‍යාපාරය.
2. අදහස → අවස්ථාව → ගැටලුව → සාර්ථක ව්‍යාපාරය
3. අවස්ථාව → ගැටලුව → අදහස → සාර්ථක ව්‍යාපාරය
4. ගැටලුව → අදහස → අවස්ථාව → සාර්ථක ව්‍යාපාරය
5. සාර්ථක ව්‍යාපාරය → අදහස → අවස්ථාව → ගැටලුව (...........)

24. ස්ථිර සේවක සංඛ්‍යාව 50 ට අඩු ව්‍යාපාර කුඩා ව්‍යාපාර ලෙස හඳුන්වා ඇති ආයතනය වන්නේ,
1. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
2. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය.
3. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.
4. කාර්මික තාක්ෂණික ආයතනය.
5. කාර්මික සංවර්ධන මණ්ඩලය. (...........)

25. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා උපදේශන සේවා සපයන ආයතනයක් නොවන්නේ,
1. කාර්මික සංවර්ධන මණ්ඩලය.
2. අපනයන සංවර්ධන මණ්ඩලය
3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
4. කාර්මික තාක්ෂණික ආයතනය
5. ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය. (...........)

26. කුඩා ව්‍යාපාරිකයෙකුට පාලනය කළ නොහැකි සාධක ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. ප්‍රාග්ධනය, සේවකයින්
2. නිෂ්පාදන ධාරිතාව, අමුද්‍රව්‍ය
3. වෙළඳපොළ, තරගකරුවන්
4. සේවකයන්, නිෂ්පාදන ධාරිතාව
5. තරඟකරුවන්, සේවකයන්. (...........)

27. පහත පළමු තීරුවෙන් මුල්‍ය ආයතන කිහිපයක් හා දෙවන තීරයෙන් ඒවායෙන් ඉටුකෙරෙන කාර්යයන් කීපයක් දැක්වේ.

ආයතනය	කාර්යාල
A ලියාපදිංචි මුල්‍ය සමාගම්	1. ඉතිරිකිරීමේ තැන්පතු පවත්වාගෙන යාම, කාලීන තැන්පතු පවත්වාගෙන යාම. මධ්‍ය හා දිගුකාලීන ණය සැපයීම
B බලපත්‍රලාභී වාණිජ බැංකු	2. ආයෝජන කළමනාකරණ උපදෙස් දීම. ව්‍යාපෘති වාර්තා සැකසීම. මුල්‍ය හා අලෙවි උපදෙස් සේවා සැපයීම.
C වණික් බැංකු	3. ඉල්ලුම් තැන්පතු පවත්වාගෙන යාම. විදේශ විනිමය කටයුතු වල යෙදීම. බැංකු අණකර පහසුකම් සැපයීම.
D බලපත්‍රලාභී විශේෂිත බැංකු	4. කුලීපිට නය මූල්‍යකරණය. කල්බදු මූල්‍යකරණය. ඉඩම් හා දේපල වෙළඳාම් කටයුතු

ආයතන හා කාර්ය නිවැරැදිව ගළපන ලද පිළිතුර තෝරන්න,

1. A-1, B-4, C-3, D-1 2. A-1, B-2, C-3, D-4 3. A-3, B-1,C-4,D-2
4. A-4,B-3, C-2, D-1 5. A-4, B-1, C-3, D-2 (...........)

28. පහත සඳහන් දෑ අතරින් මුදල් ආදේශකයක් ලෙස සැලකෙන්නේ,
1 ණය පත. 2. භාණ්ඩාගාර බැඳුම්කරය. 3. භාණ්ඩාගාර බිල්පත්
4. වාණිජ පත්‍රිකාව 5. විනිමය බිල්පත. (...........)

29. මහ බැංකුව බැංකුකරුවන්ගේ බැංකුව ලෙස සැලකෙනුයේ,
1. රජයේ බැංකුව ලෙස කටයුතු කරන නිසාය.
2. ව්‍යවහාර මුදල් නිකුත් කරන නිසාය.
3. බැංකු තුලනායතනයක් පවත්වාගෙන යන නිසාය.
4. බැංකුවල ගිණුම් පවත්වාගෙන යන නිසාය.
5. බැංකු පිහිටුවීමට බලපත්‍ර නිකුත් කරන නිසාය. (...........)

30. මහජනයාගේ තැන්පත් භාරගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලය ලැබූ ආයතනයකි,
1. වණික් බැංකු. 2. කල්බදු සමාගම්. 3. ඒකකභාර.
4. ලියාපදිංචි මූල්‍ය සමාගම් 5. රක්ෂණ සමාගම්. (...........)

- **31 සිට 40 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31 (අ) පසුගිය සමය තුල රටතුල ඇති වූ අස්ථාවරභාවය .... පරිසර තත්වයක් වන අතර එමඟින් ව්‍යාපාර හා ආයෝජන කෙරෙහි දැඩි බලපෑමක් එල්ල විය.

(ආ) ජීවන වියදම ඉහළ යාම, දළ ජාතික නිෂ්පාදිතයේ පහළ බැසීම ආදිය .... පරිසර තත්ත්වයක් ලෙස සැලකේ.

32. (අ) 'සමානාත්මතාවය' යන්න .... තිරසාර සංවර්ධනය හා .... තිරසාර සංවර්ධනය තුළින් ඇතිවන තත්වයකි.

(ආ) 'ජීවත්විය හැකි බව' යන්න .... තිරසාර ආරක්ෂණය හා .... තිරසර සංවර්ධනය තුළින් ඇතිවන තත්වයකි.

33. (අ) රජයේ පිස්කල් ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ (අ) .... ආරක්ෂා කර ගැනීම වන අතර රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ දේශීය ආර්ථිකය තුළ (ආ) .... පවත්වා ගැනීමයි.

(ආ) 2017 වසරේ දී මුළු රාජ්‍ය ආදායමෙන් බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (අ) .... ක් වන අතර බදු නොවන ආදායම (ආ) .... ක් වේ.

34. (අ) වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම (අ) .... අයත්වන අතර ණය ලබාදෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම (ආ) ....අයත්වේ.

(ආ) ශ්‍රී ලංකාවේ බදු සම්බන්ධයෙන් (අ) .... බලපැවැත්වෙන අතර, එය (ආ) .... දින සිට ක්‍රියාත්මකවේ.

35. (අ) ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම (අ) .... පනත යටතේ මගින් සිදුවන අතර,

(ආ) සමාගම් සංස්ථාපනය සිදුකරනු ලබන්නේ .... පනතට අනුවයි.

36. (අ) හවුල් ව්‍යාපාර වල ආයෝජිත ප්‍රාග්ධනය රුපියල් දාහට වැඩි නම් එය ලිඛිත ගිවිසුමක් යටතේ පැවතිය යුතු බව .... පනතින් දක්වා ඇති අතර,

(ආ) සීමා සහිත පොදු සමාගමක ව්‍යාපාර කටයුතු ඇරඹීමට .... සහතිකය ලබා ගත යුතුය.

37 (අ) 'ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වයයි' යනුවෙන් .... ඉදිරිපත් කර ඇති අතර,

(ආ) 'නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථකව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි' යනුවෙන් .... නිර්වචනය කර ඇත.

38. (අ) පුද්ගලයෙකු ඔහුට ආවේනික වූ එකම ආකාරයකට සිතීම ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහි අභියෝගයකි. එම පුද්ගලය ලක්ෂණය .... ලෙස හඳුන්වයි.

(ආ) රට රටවල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන එම අවශ්‍යතා හා වුවමනා සපුරා ලීමට තම නිෂ්පාදිත ලබාදීම .... ලෙස හඳින්වේ.

39. (අ) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරිගැන්වීම් ලබාදෙන ආයතන අතරින් NEDA යන කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන ආයතනය .... වන අතර,

(ආ) SLCSMI කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන්නේ .... යන ආයතනය වේ.

40. (අ) ඇමරිකා එක්සත් ජනපද ඩොලර් එක හා ශ්‍රී ලංකා රුපියල් අතර අද පවතින විනිමය අනුපාතිකය වන්නේ .... වේ.

(ආ) මූල්‍ය ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය හා ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ආධාර වන ගෙවීම් පියවීම් පද්ධති .... යටතට ගැනේ.

- **41 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ප්‍රජා පරිසරයේ දක්නට ඇති ප්‍රධාන සාධක හතරක් සඳහන් කරන්න.
    1. ....
    2. ....
    3. ....
    4. ....

42. ගෝලීය පරිසරය තුළ දක්නට ඇති ව්‍යාපාර වලට බලපෑම් කරන තත්ත්වයන් හතරක් සඳහන් කරන්න.
    1. ....
    2. ....
    3. ....
    4. ....

43. ව්‍යාපාර සමාජ වගකීම ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත්විඳිය හැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.
    1. ....
    2. ....
    3. ....
    4. ....

44. රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහය හා මග පෙන්වීම වැදගත් වීමට හේතුවන කරුණු හතරක් ලියන්න.
    1. ....
    2. ....
    3. ....
    4. ....

45. පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත් කර ඇති පාරිභෝගික අයිතිවාසිකම් හතරක් ලියන්න.
    1. ....
    2. ....
    3. ....
    4. ....

46. සංස්ථාපිත සමාගමක් ලියාපදිංචියට අදාළ ලියවිලි 4 නම් කරන්න.
    1. ....
    2. ....
    3. ....
    4. ....

47. පුද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග වී ඇති ආකාරය,
    1. ....
    2. ....
    3. ....
    4. ....

48. ව්‍යවසායකත්ව කුසලතා 4 නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

49. කුඩා ව්‍යාපාර වල අසාර්ථකත්වයට බලපාන හේතු හතරක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

50. ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

32 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 12 - 2019

විභාග අංකය ....

ව්‍යාපාර අධ්‍යයනය II

කාලය පැය තුනයි

උපදෙස්

♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

01. (i) (අ) ව්‍යාපාරයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න (ලකුණු 2)
(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) සමීර විසින් e-bay හරහා ඔරලෝසුවක් මිල දී ගන්නා ලදි. මෙහි වෙළඳපොලක් නොපවතින බව ඇතමුන්ගේ අදහසයි. වෙළඳපල යන්න අර්ථ දක්වා මෙම ගනුදෙනුව වෙළඳපළක් තුළ සිදුවී ඇත්දැයි දක්වන්න. (ලකුණු 4)

(iii) (අ) ඍජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) වාණිජ්‍ය යන්න ගැලීම් සටහනක් මගින් පුළුල්ව බෙදා දක්වන්න. (ලකුණු 2)

(iv) (අ) විද්‍යුත් වාණිජ්‍ය වර්තමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) වර්තමාන තොරතුරු තාක්ෂණික දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවී ඇති නව ප්‍රවනතා සඳහන් කරන්න. (ලකුණු 2)

(v) විමල් විසින් තම නිවස ආශ්‍රිතව යෝගට් නිෂ්පාදනය උදෙසා පෞද්ගලික සමාගමක් ආරම්භ කරන ලදී. මෙම ආයතනය තුළ සේවකයින් පස් දෙනෙක් සේවය කරනු ලබයි. ඉහත ව්‍යාපාරය නිෂ්පාදනයේ ස්වභාවය අනුව, හිමිකාරීත්වය අනුව, අරමුණු අනුව, පරිමාණය අනුව හා නිෂ්පාදන අංශය අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 4)

02. (i) මහ බැංකු වාර්තාව අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ නව වර්ගීකරණය දක්වන්න. (ලකුණු 4)

(ii) (අ) ව්‍යාපාර කාර්යයක් ලෙස පර්යේෂණ හා සංවර්ධනය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) කුමාර විසින් සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙස ඉදල් නිශ්පාදනය ඇරඹී ය. දැනට සේවකයින් 6 දෙනෙකු මේ සේවයේ නිරත අතර දිනකට ඉදල් 180 ක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම ව්‍යාපාරයට අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය යෙදවුම් නිමවුම් ක්‍රියාවලියක් ලෙස දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) ණයහිමියන් ව්‍යාපාරය කෙරෙහිද උනන්දුවක් දැක්වීමට හේතු දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) රජය ව්‍යාපාර වලට වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) (අ) අභ්‍යන්තර පරිසර සාධක හා ආසන්න පරිසර සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) රශ්මිකගේ ව්‍යාපාරයේ සේවකයින් නිසා ව්‍යාපාරය තුල දුර්වලතා රැසක් ඇතිවී ඇති බව කලමනාකරණ උපදේශකයෙක් පවසයි. එසේ සේවකයින් නිසා ඇතිවිය හැකි දුර්වලතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කිරීමේදී සලකා බැලිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) සමාජ හා සංස්කෘතික තිරසර බව උදෙසා ව්‍යාපාරයකට දායක විය හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

03\. (i) (අ) ආචාරධර්ම පද්ධතියක් සැකසීමේ දී සමාජ සංස්කෘතිය පිළිබඳ සැලකිලිමත් විය යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම හා සමාජ වගකීම් ඉටුකිරීම පිළිබඳව පෙරට වඩා මහජනතාවගේ අවධානය වැඩි වශයෙන් යොමු වීමට හේතු සඳහන් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) (අ) තිරසර සංවර්ධනය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) රටක ආර්ථික වර්ධනයට වඩා තිරසර සංවර්ධනය වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාරවලට වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) (අ) මූල්‍ය හා ගිණුම් කරන ආචාර ධර්ම පිළිපැදීමේ ඇති වර්තමාන වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් සැකසීමේ දී සංවිධාන සංස්කෘතිය පිළිබඳව සැලකිලිමත් විය යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) රජයක් විසින් ව්‍යාපාර සඳහා බලපෑම් කළ හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර රජයේ අරමුණු ඉටුකර දීමට විවිධාකාරයෙන් දායකත්වය ලබාදේ රජයේ අරමුණු ඉටුකර දීමට ව්‍යාපාර දායක වන ආකාර හතරක් නම් කර විස්තර කරන්න. (ලකුණු 2)

04\. (i) රාජ්‍ය ආදායම වර්ග කර එක් එක් වර්ග වලට අයත් බදු වර්ග දක්වන ගැලීම් සටහනක් අඳින්න.(ලකුණු 4)

(ii) (අ) රජය විසින් ඉටුකර ගැනීමට කටයුතු කරනු ලබන ආර්ථික අරමුණු හතරක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(ආ) රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) රාජ්‍ය වියදම වර්ග කර, ඒ එක් එක් වියදම් වර්ග නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) කෙටියෙන් පැහැදිලි කරන්න.

1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය. (ලකුණු 1)
2. නිත්‍ය ණය පහසුකම් අනුපාතය (ලකුණු 1)

(iv) (අ) පාරිභෝගික ආරක්ෂණය අතීතයට වඩා වර්තමානයේ අවශ්‍ය වීමට හේතු මොණවාද? (ලකුණු 2)

(ආ) තාර්කික පාරිභෝගිකයකු වෙළෙඳපොළ තුළ කෙසේ හැසිරෙන්නේද යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 2)

(v) (අ) පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත්වන වාසි 4 බැගින් දක්වන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 2)

II කොටස

05 . (i) (අ) 'රජය අර්ථ ක්‍රමයක ප්‍රධාන සේවායෝජක ලෙස කටයුතු කරයි.' පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) අර්ථ ක්‍රමයක ප්‍රධාන ආර්ථික කාරක සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) පොදු අරමුණු ඉටු කරන සමාජ ඒකක හෙවත් විධිමත් ව්‍යාපාර සංවිධාන ලෙස රෝහල්, පන්සල් හා සුපිරි වෙළඳසැල් වැනි ආයතන පෙනී සිටී. මෙම විධිමත් ව්‍යාපාර සංවිධාන වල දැකිය හැකි පොදු ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා භාණ්ඩ හා සේවා සපයන ව්‍යාපාර වලට උදාහරණ දෙක බැගින් දෙන්න. (ලකුණු 2)

(iii) (අ) ව්‍යාපාර වර්ගීකරණ නිර්ණායක අතර හිමිකාරීත්වය අනුව වර්ගීකරණය වැදගත් වන අතර රාජ්‍ය හිමිකාරීත්වය අනුව ව්‍යාපාර වර්ගීකරණය ගැලීම් සටහනකින් දක්වන්න. (ලකුණු 2)

(ආ) වගකීම අසීමිත වූ පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් නම් කරන්න.
ඔබ නම් කළ ව්‍යාපාර සංවිධාන වර්ග දෙක ලියා පදිංචි කිරීම අනිවාර්ය වේ ද? ඒ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 2)

(iv) (අ) සසිත, අසිත හා තුසිත යන සොහොයුරන් තිදෙනා නීතිය පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇති අතර ඉන් ඵලදායි ඉපයීමක් අපේක්ෂාවෙන් නීතිඥ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මොවුන්ට ඇරඹීමට සුදුසු ම ව්‍යාපාර සංවිධානය නම් කර ඊට හේතු දක්වන්න. (ලකුණු 2)

(ආ) ඔබ සඳහන් කළ ව්‍යාපාරයේ අනිවාර්යයෙන් තිබිය යුතු ලක්ෂණ හතරක් හා එහි දැකිය හැකි සීමා හතරක් ලියන්න. (ලකුණු 2)

(v) (අ) රාජ්‍ය සංස්ථා නිර්වචනය කර සංස්ථා හඳුන්වන විවිධ නම් හතරක් ලියන්න. (ලකුණු 2)

(ආ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථා ගණයට ගැනෙන ව්‍යාපාර අකාර්යක්ෂම වීමට හේතු හයක් ලියන්න. (ලකුණු 2)

06. (i) (අ) හවුල් ව්‍යාපාර හා සංස්ථාපිත පෞද්ගලික සමාගම් පහත ලක්ෂණ මත සසඳන්න.

1. ලියාපදිංචිය 2. සංඛ්‍යාව 3. වගකීම
4. නෛතික පුද්ගල බව 5. පැවැත්ම 6. පාලනය (ලකුණු 2)

(ආ) 2007 අංක 7 දරණ සමාගම් පනත සංස්ථාපිත සමාගම් ලියාපදිංචියට පමණක් නොව ව්‍යාපාර සංවිධාන වල සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමට ද බලපායි. එලෙසටම මෙම පනත් මගින් ලියාපදිංචි වන හා සාමාජික සංඛ්‍යාව තීරණය කරන ව්‍යාපාර සංවිධාන වර්ග වෙනම දක්වන්න. (ලකුණු 2)

(ii) (අ) පහත දැක්වෙන ව්‍යාපාර වර්ග හිමිකාරිත්වය හා ඒවා අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ග දක්වන්න.

ව්‍යාපාරය

1. සමගි ස්ටෝර්ස්.
2. ඩේවිඩ් සහ පුත්‍රයෝ
3. සෙලින්කෝ PLC
4. ශ්‍රී ලංකා විදුලි (පෞද්.) සමාගම.
5. ශ්‍රී ලංකා මැලිබන් බිස්කට් සමාගම
6. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (ලකුණු 2)

(ආ) 'පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග අතරින් සීමිත පොදු සමාගම් රටේ ආර්ථිකයට වඩා වැදගත්වේ.'
ඉහත ප්‍රකාශයට ඔබ ඔබ එකඟ ද? එසේ නම් ඊට හේතු දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) ජාත්‍යන්තර සමුපකාර සංවිධානය දක්වා ඇති ආකාරයට සමුපකාර ව්‍යාපාරය අර්ථ දක්වන්න. (ලකුණු 2)

(ආ) මැන්චෙස්ටර් සමුළු සංවිධානය මගින් ප්‍රකාශයට පත් කළ සමුපකාර ප්‍රතිපත්ති නම් කරන්න.(ලකුණු 2)

(iv) (අ) ව්‍යාපාර සංයෝජන යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා ව්‍යාපාර සංයෝජනය වන ආකාර දෙකක් නම් කර ඒවායින් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) සීමාසහිත ලිට්‍රෝ ගෑස් සමාගම රාජ්‍ය සමාගමකි. මෙම රාජ්‍ය සමාගම් වල ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 2)

(v) ලෝකයේ බොහෝ රටවල් වල ව්‍යාපාර සංවර්ධනය සඳහා සාධකයක් වී ඇත්තේ ව්‍යසායකත්වයයි. 'ජෝසප් ෂුම් පීටර්' ඉදිරිපත් කර ඇති පරිදි 'ව්‍යවසායකත්වය' හා 'ව්‍යවසායකයා' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 4)

07. (i) (අ) ව්‍යසායකත්වයේ සාමාජීය හා ආර්ථික ප්‍රතිලාභ 8ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) 'ආර්ථිකයක් තුළ පවතින සියලු ව්‍යවසායන් ව්‍යාපාර වන අතර සියලු ව්‍යාපාර ද ව්‍යවසායන් වේ' මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 2)

(ii) නූතනයේ ව්‍යවසායකත්වයේ ප්‍රවණතා රාශියක් දැකිය හැක. ඒවා අතරින් අභ්‍යන්තර ව්‍යවසායකත්වය හා සමාජයීය ව්‍යවසායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) තරිඳු ව්‍යවසායකත්ව කුසලතා සහිත අයෙක් වුවද ඔහුගේ පියා පවසා සිටින්නේ තව දුරටත් ඔහුගේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත යුතු බවයි. තරිඳුට තම ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකත්ව ක්‍රියාවලිය නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල ලක්ෂණ අටක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) 'රටක ආර්ථික සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල දායකත්වයක් සපයයි' එම දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා මහා පරිමාණ කර්මාන්ත අතර අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබාදෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන 4 බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

08. (i) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබා දීම සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති රාශියකි. එවැනි ව්‍යාපෘති හතරක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) අන්තර්ජාල බැංකුකරණය (internet banking) යනු කුමක්ද? (ලකුණු 2)

(ආ) අන්තර්ජාල බැංකුකරණයේ වේගවත් ව්‍යාප්තියට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු හැසිරවීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ණය සාධ්‍යකරණ ආයතනයක් යනු කුමක්ද? (ලකුණු 2)

(iv) (අ) මුල්‍ය ආයතන පද්ධතියේ විශේෂිත මුල්‍ය ආයතන වලට අයත් ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) හොඳ මුදලක ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) විද්‍යුත් මුදල් මගින් ගෙවීම් පහසුකිරීම සඳහා ඇති පහසුකම් හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ඒකක භාරයක් පාර්ශව තුනකින් සමන්විත වේ. එම පාර්ශව නම් කරන්න. (ලකුණු 2)

දෙවන වාර පරීක්ෂණය - 2019
12 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
I පත්‍රය

(01)	- 3	(11)	- 5	(21)	- 1
(02)	- 2	(12)	- 3	(22)	- 2
(03)	- 1	(13)	- 3	(23)	- 1
(04)	- 4	(14)	- 5	(24)	- 2
(05)	- 4	(15)	- 2	(25)	- 5
(06)	- 3	(16)	- 5	(26)	- 3
(07)	- 3	(17)	- 3	(27)	- 4
(08)	- 5	(18)	- 4	(28)	- 1
(09)	- 1	(19)	- 2	(29)	- 4
(10)	- 2	(20)	- 2	(30)	- 4

31. (අ) දේශපාලන (ආ) ආර්ථික
32. (අ) සමාජ, ආර්ථික (ආ) පාරිසරික, ආර්ථික
33. (අ) සාර්ව ආර්ථික ස්ථායිතාව , මිල ස්ථායිතාව, උද්ධමන පාලනය
    (ආ) 12.6% , 1.2%
34. (අ) ප්‍රමාණාත්මක ණය පාලනය, ගුණාත්මක ණය පාලනය
    (ආ) 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත, 2018 අප්‍රේල් 01
35. (අ) 1992 අංක 11 දරණ සමුපකාර සමිති පණත, සමුපකාර සංවර්ධන කොමසාරිස්
    (ආ) 2007 අංක 07 දරණ සමාගම්
36. (අ) 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥා පණත
    (ආ) සංස්ථාපන / සංස්ථාගත කිරීමේ සහතිකය
37. (අ) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය (ආ) අන්තර්ජාතික කම්කරු සංවිධානය
38. (අ) මනෝවිභීතිය / මනෝභාවය (ආ) ගෝළීය ව්‍යවසායකත්වය
39. (අ) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය.
    (ආ) ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය.
40. (අ) වත්මන් විදේශ විනිමය අනුපාතය (ආ) මූල්‍ය යටිතල පහසුකම්
41. 1. ජනගහනයේ ප්‍රමාණය 2. ජනගහන වර්ධන අනුපාතය 3. ස්ත්‍රී පුරුෂ භාවය 4. වයස් ව්‍යුහය 5. පිළිගත හැකි වෙනත්.
42. 1. වෙළඳ ගිවිසුම් ඇති වීම. 2. වෙළඳ හවුල් ඇතිවීම. 3. ලෝක සංවිධාන බිහිවීම. 4. අන්තර්ජාතික වශයෙන් නීතිරීති ඇති කිරීම. 5. පිළිගත හැකි වෙනත්
43. 1. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම 2. ව්‍යාපාරයක ප්‍රතිරූපය කීර්තිනාමය වර්ධනය වීම. 3. ව්‍යාපාරය පිළිබඳ විශ්වාසනීයත්වය තහවුරු වීම. 4. ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකිවීම. 5. ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ වලට ළඟාවීමට පහසු වීම.
44. 1. ව්‍යාපාර ලියාපදිංචියට යොමුවීම. 2. කීර්තිනාමය වර්ධනය වීම. 3. රටේ සංවර්ධනයට දායක වීම. 4. රජයේ හා මහජනයාගේ පිළිගැනීම.
45. 1. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය. 2. වන්දි ලබාගැනීමට ඇති අයිතිය. 3. පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය 4. සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය.
46. 1. සමාගම් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය. 2. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය. 3. සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය. 4. සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කිරීමට කැමැත්ත දක්වන ප්‍රකාශය. 5. සමාගමේ ලේකම්වරයෙකු ලෙස කටයුතු කිරීමට කැමැත්ත දක්වන ප්‍රකාශය.
47. 1. කේවල 2. හවුල් 3. සංස්ථාපිත සමාගම්. 4. සමුපකාර
48. 1. නායකත්ව කුසලතා. 2. අන්තර් පුද්ගල කුසලතා. 3. සන්නිවේදන කුසලතා. 4. මූලික කළමනාකරණ කුසලතා.
49. 1. කළමනාකරණ දුර්වලතා. 2. මූල්‍ය ගැටලු 3. ව්‍යවසායකත්ව හැකියා අඩුවීම. 4 තරගකාරීත්වයට මුහුණ දීමට අපහසු වීම. 5. පිළිගත හැකි වෙනත්.
50. 1. රාජ්‍ය ණය කළමනාකරණය. 2. විදේශ විනිමය පාලනය 3. කුඩා පරිමාණ මූල්‍ය කරන වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම. 4. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීම.

II - කොටස

01. (i) (අ) ව්‍යාපාරයක් යනු ලාභ ලැබීමේ අරමුණින් හෝ ලාභ ලැබීමේ අරමුණින් තොරව මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලුම කටයුතු වේ.(ල 2)

(ආ) භාණ්ඩ හා සේවා අතර පිළිගත හැකි වෙනස්කම් 4 කට ලකුණු දෙකක් ලබා දෙන්න.
(වෙනස්කමකට ලකුණු භාගය බැගින් කරුණු 4 ට ලකුණු 2)

(ii) ගැණුම්කරුවන් හ විකුණුම්කරුවන් මුණගැසෙන හෝ සම්බන්ධවන ඕනෑම තත්ත්වයක් වෙළඳපොලකි.(ලකුණු 2) එබැවින් නිශ්චිත ස්ථානයක් තුල සිදු නොවුවද අන්තර්ජාලය තුල අවකාශයද වෙළෙඳ පොළක් ලෙස සැලකෙන බැවින් ඉහත ගනුදෙනුවද වෙළෙඳපොළ තුළ සිදුවී ඇත. (ලකුණු 2)

(iii) (අ) තමාට අවශ්‍ය කරන දෑ තමන් විසින්ම නිෂ්පාදනය කර ගැනීම ඍජු නිෂ්පාදනය වේ. (ලකුණු 1)
වක්‍ර නිෂ්පාදනය යනු වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනය කිරීමයි. (ලකුණු 1)

(ආ)



(ලකුණු දෙකයි)

(iv) * ව්‍යාපාර කටයුතු වේගවත් වීම. * මෙහෙයුම් පිරිවැය, තොග පිරිවැය අඩුවීම.
* ලියවිලි වලින් තොරව අදාළ කටයුතු සිදුවීම. * ගෝලීය වෙළෙඳපොළ අවකාශයක් බිහිවීම
* ගනුදෙනුකරුවන්ගේ කාලය හා ශ්‍රමය ඉතුරු වීම. * පරිගණක සාක්ෂරතාව ඉහළ යාම
* යටිතල පහසුකම් වර්ධනය වීම. (කරුණු 4 කට ලකුණු 2)

(ආ) * ගෝලීයකරණය ව්‍යාප්තවීම. * විද්‍යුත් ව්‍යාපාර බිහිවීම. * විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම
* පරිසරය පිළිබඳ සැලකිලිමත්වීම. * ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත්වීම.(කරුණු 4 ට ලකුණු 2)

(v) නිෂ්පාදනයේ ස්වභාවය අනුව - ද්විතීක ව්‍යාපාර
හිමිකාරිත්වය අනුව - පුද්ගලික අංශයේ සමාගමකි
අරමුණු අනුව - ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
පරිමාණය අනුව - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.
නිෂ්පාදන අංශය අනුව - කාර්මික ව්‍යාපාරයකි.
(කරුණු 3ක් නිවැරදි නම් ලකුණු 2, කරුණු පහම නිවැරදි නම් ලකුණු 4)

02. (i) * පතල් හා කැණීම් කර්මාන්තය. * නිෂ්පාදන කර්මාන්ත. * විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයීම. * ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම, * මළ ප්‍රවහන කටයුතු කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය.
* ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන්. (කරුණු සියල්ලම නිවැරදි නම් ලකුණු හතරයි)

(ii) (අ) පර්යේෂණ පැවැත්වීම තුළින් නව නිර්මාණ වලට අදාළ තොරතුරු රැස් කිරීම, නිෂ්පාදන වැඩිදියුණු කිරීම හා අඩු පිරිවැය ක්‍රම සොයා බැලීම ආදිය පර්යේෂණ හා සංවර්ධන කාර්යය අතරට ගැනේ. (පැහැදිලි කිරීමට ලකුණු දෙකයි)

(ආ) යෙදවුම් → නිෂ්පාදන ක්‍රියාවලිය → නිමැවුම්
* යෙදවුම් යටතේ භූමිය, ශ්‍රමය ආදී වශයෙන් සඳහන් කොට ඇත්නම් ලකුණු ලබා නොදෙන්න.
* ඉදලක් නිෂ්පාදනයට අවශ්‍ය ගොඩනැගිලි, උපකරණ, ලී, මිටි, ඉරටු, තහඩු කැබලි, ඇණ, ඉදල් සාදන්නන්ගේ ශ්‍රමය ආදිය එහි සඳහන් විය යුතු අතර, නිෂ්පාදන ක්‍රියාවලියද ප්‍රායෝගික විය යුතුය. අවසන් නිෂ්පාදිතය ලෙස ඉදල සඳහන් කර තිබිය යුතුයි. එසේ නම් පමණක් ලකුණු දෙකක් ලබා දෙන්න.

(iii) (අ) * සපයන ලද ණය මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීම.
* ණය මුදලේ සුරක්ෂිත බව දැනගැනීම. * ඇප සුරකුම් වල සුරක්ෂිත බව තහවුරු කරගැනීම. (කරුණු දෙකක් දැක්වීමට ලකුණු එකයි. පැහැදිලි කිරීම් වලට ලකුණු එකයි)

(ආ) බදු සහන ලබාගැනීමට. * යටිතල පහසුකම් ලබා ගනීමට. * තාක්ෂණික දැනුම ලබා ගැනීමට. (ගැලපෙන කරුණු දෙකක් සඳහන් කිරීමට ලකුණු 1, පැහැදිලි කිරීම් වලට ලකුණු 1)

(iv) (අ)

අභ්‍යන්තර පරිසරය	ආසන්න පරිසරය
* අයිතිකරුවන්	* සැපයුම්කරුවන්
* කළමනාකරුවන්	* පාරිභෝගිකයින්
* සේවකයින්	* තරඟකරුවන්
* සංවිධාන ව්‍යුහය	* ආදේශන භාණ්ඩ නිෂ්පාදකයින්
* සංවිධාන සංස්කෘතිය	* වෙළඳපොළට පිවිසීමට අපේක්ෂා කරන නව
* සංවිධාන සම්පත්	ව්‍යාපාරිකයින්.

(කරුණු 4කට ලකුණු 1 බැගින් කරුණු 8 ලකුණු දෙකයි)

(ආ) * නුපුහුණු සේවකයින් සිටීම. * වගකීමෙන් හා වගවීමෙන් තොර සේවා සේවකයින් සිටීම.
* අයහපත් වැඩ පුරුදු පැවතීම. * සෘණ ආකල්ප දැරීම. * අකාර්යක්ෂම සේවකයින් සිටීම.(කරුණු4කට ලකුණු 2)

(v) (අ) ආර්ථික වර්ධනය හා ස්ථායිතාව. * සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය. * සාධාරණව තරඟ කිරීම. * නිෂ්පාදනය හා පරිභෝජනය. * සේවා නියුක්තිය. * අන්තර්ජාතික වෙළඳාම.(කරුණු හතරකට ලකුණු දෙකයි)

(ආ) * ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම. * ජනතාවට සමාන අවස්ථා සැපයීම.
* සමාජ ඒකාග්‍රතාව ඇති කිරීම * ජාත්‍යන්තර සහභාගිත්වය ලබා ගැනීම.
* මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම. * දේශීය සංස්කෘතිය, සම්ප්‍රදායන් හා සිරිත් විරිත් ආරක්ෂා කිරීම. * සංස්කෘතික පරිසරය සුරැකීම. * දුගී බව අවම කිරීමට කටයුතු කිරීම. * සේවක සම්බන්ධතා
(කරුණු 4 කට ලකුණු 2)

03. (i) (අ) ජනතාව තුළ මුල්බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම්, උප සංස්කෘතීන් ගැන සැලකිලිමත් වෙමින් ආචාරධර්ම පද්ධතිය සකස් කළ යුතුවේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) පෙරට වඩා වර්තමානය වන විට පාරිභෝගිකයින් හා මහජනතාව තාර්කික වී ඇති අතර මහජනතාව දැනුවත් වන ක්‍රමවේදය ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඔස්සේ ඉහළ ගොස් ඇත. එසේම ඔවුන් ව්‍යාපාර පිළිබඳව අවදියෙන් සිටින ස්වරූපයක් ද දක්නට ලැබේ. එමෙන්ම මහජනයා හා පාරිභෝගිකයින්ගේ සංවිධාන ශක්තිය ද පෙරට වඩා ඉහළ ගොස් ඇත. නීතිරීති අණපනත් ආදිය ද පෙරට වඩා බරපතළ ලෙස ව්‍යාපාර වලට බලපායි. එම නිසාම පෙරට වඩා මහජනතාව ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම හා සමාජ වගකීම් ඉටුකිරීම පිළිබඳව අවධානයෙන් සිටී. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ii) (අ) තිරසර සංවර්ධනය යනු, අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමේ අයිතිය උල්ලංඝනය නොකරමින් ඔවුන් සඳහාද සම්පත් සුරක්ෂිත කරමින් ලඟාකරගන්නා වූ සංවර්ධනයයි. (පැහැදිලි කිරීමට ලකුණු දෙකයි)

(ආ) ආර්ථික වර්ධනය යනු, රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යාමක් පමණි.නමුත් තිරසර සංවර්ධනයේ දී ආර්ථික වර්ධනයට අමතරව අනාගත පරම්පරාව උදෙසා සම්පත් සුරක්ෂිත කිරීම, අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජයීය ආදී ක්ෂේත්‍ර වල වර්ධනයන්, දරිද්‍රතාව අඩු කිරීම ආදී පුළුල් පරාසයන් පිළිබඳව සලකා බලන බැවින් ආර්ථික වර්ධනයට වඩා තිරසර සංවර්ධනය පුළුල් හා වැදගත් සංකල්පයක් වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(iii) * පාරිභෝගික විශ්වාසය ඉහළ යාම. * පක්ෂපාතී ගනුදෙනුකරුවන් බිහිවීම. * ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම. * තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම. * මූල්‍ය අක්‍රමිකතා හා විෂමාචාර පිටුදැකීමේ හැකියාව. * යහපත් මානව සම්පත් කළමනාකරණයක් පවත්වාගත හැකිවීම.
(ඉහත කරුණු හතරක් වත් අවම වශයෙන් ඇතුළත් වන පැහැදිලි කිරීම් සහිත පිළිතුරකට ලකුණු 4)

(iv) (අ) වර්ථමානයේ ව්‍යාපාර තුළ සිදුවන මූල්‍ය අක්‍රමිකතා දූෂණ හා විෂමාචාර ආදිය ඉහළගොස් ඇත. එබැවින් මූල්‍යමය හා ගිණුම්කරණ ආචාර ධර්ම පිළිපැදීම පෙරටත් වඩා වර්තමානය වන විට ඉහළත තත්වයන් අවම කිරීමට ව්‍යාපාර වලට වැදගත් වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) ව්‍යාපාර තුළ පවතින චාරිත්‍ර වාරිත්‍ර, චර්යාකම්, පුරුදු, ආකල්ප යනාදිය සංවිධාන සංස්කෘතියට අයත් වන අතර, ඒවාට පටහැනි නොවන ලෙස ඒවා තවදුරටත් ශක්තිමත් වන ලෙස ව්‍යාපාරයන්හි නව ආචාරධර්ම පද්ධතිය සකස් කළ යුතුයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(v) (අ) * යටිතල පහසුකම් සැපයීම. * ගනුදෙනුකරුවෙකු ලෙස. * තරඟ කරුවෙකු වීම. * නීතිරීති පනවන්නෙකු ලෙස. * ප්‍රතිපත්ති සම්පාදකයකු ලෙස. * බදු අය කරන්නෙකු වීම. (කරුණු 4 ට ලකුණු 2)

(ආ) * බදු ගෙවීම :- රජයට ගෙවිය යුතු බදු පැහැර හැරීමකින් තොරව තමා උපයාගත් ලාභය හා ආදායම මත නියමිත පරිදි බදු ගෙවීම.
* දේශීය සම්පත් භාවිතය :- හැකිතාක් උපරිමයෙන් තම නිෂ්පාදන සඳහා දේශීය සම්පත් යොදා ගැනීම.
* රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම :- රජය ක්‍රියාත්මක කරන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පිළිපැදීම.
* නීතිරීති පිළිපැදීම :- ව්‍යාපාර සඳහා පනවා ඇති නීතිරීති ඒ ආකාරයෙන් ඉටු කරමින් යහපත් ව්‍යාපාර පරිසරයක් ගොඩනැගීමට දායක වීම.
* සේවා නියුක්තියට දායකවීම :- ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ඇතුළු සියලු සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගැනීම.
* පරිසරයට වන හානිය අවම කිරීම :- සියලු ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස ඒවායේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම. (කරුණු 4 ට ලකුණු 2)

04. (i)



(ii) (අ) * ආර්ථික වර්ධනය හා සංවර්ධනය :- නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනයක් තුළින් ආර්ථික වර්ධනයයි. මානව හා සමාජ දර්ශනවල දිගුකාලීන වර්ධනය සංවර්ධනයයි.

* පූර්ණ සේවා නියුක්තිය :- ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන්ම ආර්ථිකය සතු සියලුම නිෂ්පාදන සම්පත් ඵලදායි නිෂ්පාදන කටයුත්ත යොදවා තිබීම.

* සාධාරණ ආදායම් ව්‍යාප්තිය:- රටක සමස්ත නිෂ්පාදිතය එරටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමානව බෙදාහැරීම.

* ආර්ථික ස්ථායිතාව :- ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාවයි.

* යහපත් අන්තර්ජාතික වෙළඳාම :-විදේශ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාම තුළින් ගෙවුම්ශේෂ තත්ත්වය ආරක්ෂා කරගැනීමයි. (කරුණු 4 කට ලකුණු දෙකයි)

(ආ) රජය ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් වේ. ව්‍යාපාර වර්ධනය තුළින් රජයේ අරමුණු ඉටුවේ. එසේම ව්‍යාපාර වර්ධනය නිසා රජයට බදු ආදායමක් ලබාගත හැකිය. එම ආදායම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හා අනෙකුත් කාර්යයන් සඳහා යොදා ගත හැකිය. මේ නිසා රජයත් ව්‍යාපාරත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම වැදගත් වේ. (මෙම කරුණු සියල්ල ඇතුළත් සම්පූර්ණ ලකුණු දෙකයි)

(iii) (අ) * වර්තන වියදම්. * ප්‍රාග්ධන වියදම් (ලකුණු භාගයයි)

වර්තන වියදම් : රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වසරක් තුල නැවත නැවත සිදු කළ යුතු වියදම් ය. නිදසුන් : වැටුප් හා වේතන, පොලී ගෙවීම්.

* ප්‍රාග්ධන වියදම් : රජයක් විසින් දිගුකාලීන ආයෝජන සඳහා දරන වියදම්ය.

නිදසුන් : මහා මාර්ග ඉදිකිරීම්, පාලම් ඉදිකිරීම.

(නිදසුන් දක්වමින් පැහැදිලි කිරීමට ලකුණු එකහමාරයි)

(ආ) * නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය :- වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතිකයයි.

* නිත්‍ය ණය පහසුකම් අනුපාතය : වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් රජයේ සුරකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේදී අය කරනු ලබන පොලී අනුපාතයයි. (ලකුණු දෙකයි)

(iv) (අ) * වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා සුලබ වීම. * තරඟකාරීත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමාචාර ඇතිවීමට ඉඩ වැඩි වීම. * නිදහස් වෙළඳාම සමඟ වෙළඳපොළ සංකීර්ණ වීම. * ගෝලීයකරණය සමඟ ඇතිවිය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම. * පරිසර දූෂණය වැළැක්වීම සඳහා පාරිභෝගිකයන් දැනුවත් කිරීම අවශ්‍ය වීම. (කරුණු හතරක් සහිත පිළිතුරට ලකුණු 2)

(ආ) * ගෙවන මුදලට සරිලන වටිනාකමින් යුත්, ප්‍රමිතියෙන් ඉහල භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹීම. * වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම. * තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කරගැනීම. * සමාජය පිළිබඳ සැලකිලිමත්වීම. * සහයෝගයෙන් කටයුතු කිරීම. (සම්පූර්ණ පිළිතුරට ලකුණු දෙකයි)

(v) (අ) පාරිභෝගිකයාට අත්වන වාසි

* ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම. * වෙළෙඳ විෂමාචාර වලින් ආරක්ෂා වීම. * ගුණාත්මක භාණ්ඩ හා සේවා පරිභෝජනය නිසා පාරිභෝගික සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරු වීම. * නීතිමය රැකවරණය ලබා ගත හැකි වීම. * පාරිභෝගිකයාට ජීවත්වීමට සුදුසු පරිසර තත්ත්වයක් උදාවීම.

ව්‍යාපාරිකයාට අයත්වන වාසි :

* ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනාගත හැකි වීම. * ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩිවීම තුළින් ලාභය ඉහලයාම. * ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩුවීම. * අයහපත් තරග විරෝධී ක්‍රියා නොමැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම.

(කරුණු දෙකකට ලකුණු භාගය බැගින් කරුණු 8 කට ලකුණු 2)

(ආ) * පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය. * ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය. * මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව. * මධ්‍යම පරිසර අධිකාරිය. * ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය. * දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

05. (i) (අ) රටක ආර්ථික වර්ධනය හා සංවර්ධනය පැවරෙන්නේ එරට රජයටයි. (මෙම අදහස ඇතුළත් පිළිතුරට ලකුණු දෙන්න)

(ආ) *කුටුම්භ අංශය. * ව්‍යාපාර අංශය * රාජ්‍ය අංශය * විදේශ අංශය

(ii) (අ) * අරමුණක් තිබීම. නමක් තිබීම. * පුද්ගලයින් සිටීම. * සංවිධාන ව්‍යුහයක් තිබීම. * කිසියම් ආර්ථික කටයුත්තක නියැලීම. * සම්පත් භාවිතය ආදී. (පිළිගත හැකි පිළිතුරු 4 කට 1 කට ලකුණු භාගය බැගින් ලකුණු දෙකයි)

(ආ) පුද්ගලයින්ට මිලදී ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා පද්ධතියක් සැපයීමට වර්ධනය වී ඇති ලාභ ඉපයීමට හෝ සමාජ සුබසාධනය අරමුණු කරගත් නිෂ්පාදන බෙදාහැරීමේ හා අලෙවි කිරීමේ නිරත ව්‍යවසායන් ව්‍යාපාර සංවිධාන වේ.

උදාහරණ : භාණ්ඩ සපයන ව්‍යාපාර : උළු, ගඩොල්, ලීබඩු, විදුලි උපකරණ ආදී.
සේවා සපයන ව්‍යාපාර : ප්‍රවාහන, බැංකු රක්ෂණ ආදී
(උදාහරණ සමග නිර්වචනයට ලකුණු දෙකයි)

(iii) (අ)



(නිවැරැදි පිළිතුරට ලකුණු දෙකයි)

(ආ) * තනි පුද්ගල ව්‍යාපාර, * හවුල් ව්‍යාපාර

තම නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුතුයි. (ව්‍යාපාර නම් කිරීමට ලකුණු 1 විස්තර කිරීමට ලකුණු 1)

(iv) (අ) නීතිඥ වැනි සේවා සපයන ව්‍යාපාර සඳහා හවුල් ව්‍යාපාර සුදුසු වේ. හවුල්කරුවන් 20 ට වඩා වැඩියෙන් හවුල් කරුවන් බඳවා ගත හැකි වන අතර ඔවුන්ගේ විවිධ දක්ෂතා ව්‍යාපාරයට යෙදවීම නිසා ව්‍යාපාරය වැඩි දියුණු කළ හැකි වීම.

(ආ)

ලක්ෂණ	**සීමා**
* ලාභ ලැබීමේ අරමුණක් තිබීම	* වගකීම අසීමිත වීම
* ව්‍යාපාර කටයුත්තක් පැවතීම.	* මතභේද ඇතිවිය හැකි වීම.
* පුද්ගලයින් සිටීම.	* අඛණ්ඩ පැවැත්ම නොතිබීම.
* අන්‍යෝන්‍ය සම්බන්ධයක් තිබීම.	* නෛතික පුද්ගලබවක් නොතිබීම.

(v) (අ) සමාගම් පනත හැර වෙනත් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලද්දා වූ හෝ පිහිටුවන්නා වූ රජය විසින් ප්‍රාග්ධනයක් හෝ නයක් වශයෙන් ද නැතහොත් වෙනස් ආකාරයකින් මුළු අරමුදල ම හෝ අරමුදලින් කොටසක් සපයන්නා වූ ද සංස්ථාවක් මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයකි.

(නිවැරදි නිර්වචනයකට ලකුණු 02 යි. දී ඇති පිළිතුර අදාළ පරිදි ලකුණු ප්‍රමාණය ප්‍රදානය කරන්න)

(ආ) 1. දේශපාලන ඇඟිලිගැසීම්. 2. දැඩි නීතිරීති හා ප්‍රතිපත්ති. 3. දූෂණ වංචා අධිකවීම.
4. ව්‍යාපාර කළමනාකරණ අත්දැකීම් බහුල පාලකයින් පත් නොවීම.
5. සම්පත් නාස්තිය. 6. සේව්‍ය - සේවක පක්ෂ අතර ආරවුල්.
(කරුණු 6ට ලකුණු දෙකයි, කරුණු තුනකට ලකුණු 1)

06. (ii) (අ)

සංඛ්‍යාව තීරණය වන ව්‍යාපාර	**2007 අංක 7 පනත බලපාන ව්‍යාපාර**
* හවුල් ව්‍යාපාර	* සීමාසහිත සමාගම්.
	* සීමාරහිත සමාගම්
	* ඇපයෙන් සීමිත සමාගම්.

(නිවැරදි පිළිතුර හතරම ඇත්නම් එකකට ලකුණු භාගය බැගින් ලකුණු 2)

(ආ)

හවුල් ව්‍යාපාර	**සංස්ථාපිත සමාගම්**
1. ලියාපදිංචිය- අනිවාර්ය නොවේ. 1918 අංක 6 බලපෑම	අනිවාර්යයි. (2007 අංක 7 පනත ට අනුව)
2. සංඛ්‍යාව - 2-20	1 - 50
3. වගකීම - අසීමිතයි	සීමිතයි
4. නෛතික පුද්ගල බව -නැත	ඇත
5. පැවැත්ම අඛණ්ඩ නොවේ.	අඛණ්ඩ වේ.
6. පාලනය - හවුල්කරුවන් මගිනි.	කොටස් කරුවන් අතරින් තේරීපත්වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි.

(ඉහත ලක්ෂණ 3ක් හරිනම් ලකුණු භාගය බැගින් ලක්ෂණ 12 ම හරිනම් ලකුණු 2)

(ii) (අ)

සංවිධාන වර්ගය	**හිමිකාරිත්වය**
1. ඒකල	පෞද්ගලික
2. හවුල්	පෞද්ගලික
3. ලැයිස්තුගත පොදු සමාගම්	පෞද්ගලික

4. සීමාසහිත පෞද්ගලික සමාගම් පෞද්ගලික
5. ලැයිස්තුගත නොවූ සමාගම් පෞද්ගලික
6. රාජ්‍ය සමාගම් පොදු
(නිවැරැදි පිළිතුරු තුනකට ලකුණු භාගය බැගින් පිළිතුරු 12කට ලකුණු දෙකයි)

(ආ) ඔව්./
* මහා පරිමාණ ව්‍යාපාර බිහිවීම. * කොටස් වෙළෙඳපොළ සංවර්ධනය. * විදේශ ආයෝජන වැඩි වීම මගින් ව්‍යාපාර පුළුල් වීම. * රැකියා අවස්ථා වැඩිවීම. * නවීන තාක්ෂණය ගලා ඒම. * දළ ජාතික නිෂ්පාදිතය වැඩිවීම. * නව උත්පාදන වැඩිවීම.
(ඔව් කියන පිළිතුරට ලකුණු භාගයයි, හතරක් දක්වා ඇත්නම් ලකුණු එකහමාරයි, කරුණු 3කට ලකුණු එකයි, කරුණු 2 ට ලකුණු භාගයයි)

(iii) (අ) ''සිය ආර්ථික සමාජීය හා සංස්කෘතිකමය අවශ්‍යතා හා අපේක්ෂා ඉටුකර ගැනීමට උදෙසා ස්වේච්ඡාවෙන් එක් එක් වූ පුද්ගලයින්ගේ ස්වාධීන සංගමයක් මෙන්ම සාමූහික අයිතිය සහිත ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය වන ව්‍යාපාරයකි.'' (සම්පූර්ණ පිළිතුරට ලකුණු 2, පිළිතුර ඉදිරිපත්කර ඇති ආකාරය අනුව ලකුණු දෙන්න)

(ආ) 1. ස්වේච්ඡා හා විවෘත සහභාගිත්වය. 2. ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය. 3. සාමාජික ආර්ථික සහභාගිත්වය. 4. ස්වෛරීභාවය හා නිදහස. 5. සමුපකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු ලබාදීම. 6. ප්‍රාදේශීය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගීතාවය. 7. සමාජය පිළිබඳ සැලකිලිමත්වීම. (එක් කරුණකට ලකුණු භාගය බැගින් කරුණු4ට ලකුණු දෙකයි)

(iv) (අ) සමාගම් දෙකක් හෝ කීපයක් එකට එකතු වී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජනයයි. ආකාර දෙකකි, 1. ඒකාබද්ධ වීම 2 අත්පත්කර ගැනීම.
ඒකාබද්ධ වීම : මෙහිදී වෙන් වෙන්ව පැවැති සමාගම් දෙකක් හෝ කීපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමයි. එය එක් සමාගමක් අනිත් සමාගමේ වත්කම් හෝ වගකීම් මිලට ගැනීමෙන් හෝ සංයෝජනය වන සමාගම්වල පැවති ව්‍යාපාර කටයුතු නිමකර ඒ අනුව නව සමාගමක් පිහිටුවීමෙන් කළ හැකි.
අත්පත්කරගැනීම : අත්පත් කර ගැනීමේ දී එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම සිදුවේ. කොටස් මිලට ගන්නා සමාගමකට පාලන බලය හිමි වේ.

(ආ) * සමාගම් පනත යටතේ සංස්ථාපනය වීම. * සීමිත පොදු සමාගමක් වීම. * මුල් ප්‍රාග්ධනයෙන් 51% ක ට වඩා වැඩි ප්‍රමාණයක් රජයේ හෝ අනුබද්ධ ආයතන සතු වීම. * වගකීම සීමිත වීම. * නෛතික පුද්ගල බවක් පැවතීම.

(කරුණු 4ක් දක්වා ඇත්නම් එක් කරුණකට ලකුණු භාගය බැගින් ලකුණු 2)

(v) නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි. (ලකුණු එකයි)
නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කරන පුද්ගලයා ව්‍යවසායකයා ය.(ලකුණු 1)

07. (ii) (අ) 1. නව ආදායම් මාර්ග විවෘත වීම. 2. නව රැකියා අවස්ථා ජනිතකිරීම. 3. නව භාණ්ඩ හා සේවා පරිභෝජනය අවස්ථා උදාවීම. 4. ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යෑම. 5. ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදාගැනීම. 6. නව වෙළඳ පොළවල් සංවර්ධනය වීම. 7. නිෂ්පාදිත වල ගුණත්වය වර්ධනය වීම. 8. දිළිඳු බව අඩුවීම. 9. ජාතික නිෂ්පාදිතය ඉහළ යාම
(කරුණු 4 ට ලකුණු භාගය බැගින් කරුණු අටකට ලකුණු දෙකයි)

(අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා ඊට අනුබද්ධිත කටයුතු ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි අතර, මිනිස් අවශ්‍යතා හා උවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්ව ලෙස හැඳින්වේ. මේ අනුව ව්‍යාපාර තුළින් ද ව්‍යවසායන් තුළින් ද මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම හා ආශ්‍රිත සේවාවල නිරත වේ. නමුත් ව්‍යාපාර වලට සාපේක්ෂව ව්‍යවසායන් විසින් ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය යන කටයුතුවල ද නිරත වේ. නමුත් ව්‍යාපාරිකයන් පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරය අරඹන සම්ප්‍රදායිකව කටයුතු කරන අයෙකි. එම නිසා සියලු ව්‍යවසායන් ව්‍යාපාර වන අතර සියලු ව්‍යාපාර ව්‍යවසායන් නොවේ. (ලකුණු දෙකයි)

(ii) **අභ්‍යන්තර ව්‍යසායකත්වය :** ව්‍යාපාර සංවිධාන වල සේවකයින්ගේ නිර්මාණශීලීත්වය තුළින් බිහි කෙරෙන ව්‍යසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වයයි. සංවිධාන වල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් එම ආයතනවල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රම වල වෙනස්කම් සිදු කිරීම තුළින් අභ්‍යන්තර ව්‍යවසායකත්වය බිහිවේ. (ලකුණු 2)

සමාජීය ව්‍යවසායකත්වය : සමාජයීය මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සමාජයීය ගැටළු වලට පිළියම් යෙදීමට නවෝත්පාදනය යෙදීම සමාජීය ව්‍යවසායකත්වය ලෙස හැඳින්වෙයි. (ලකුණු 2)

(iii) (අ) 1. වෙනත් ව්‍යවසාය වල කටයුතු කිරීමෙන් හෝ ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබන අත්දැකීම් තුළින්. 2. ව්‍යවසායකත්වය පිළිබඳව අධ්‍යාපනය ලැබීමෙන්. 3. ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය සඳහා වූ පුහුණු වැඩසටහන් මගින්. 4. ආදර්ශ චරිත අධ්‍යයනය මගින්. 5. ස්වයං ඇගයීම මගින්. (කරුණකට ලකුණු භාගය කරුණු හතරකට ලකුණු දෙකයි)

(ආ) 1. නව්‍යතා සම්පාදනය. 2. සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම. 3. අවශ්‍ය සම්පත් සම්පාදනය. 4. යථාර්ථයක් බවට පත් කිරීම. 5. ප්‍රතිලාභ ලැබීම. (ලකුණු 2)

(iv) (අ) 1. ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම. 2. පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත වීම. 3. වෙළඳපොළ කුඩාවීම. 4. තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදු වීම. 5. සේවක සංඛ්‍යාව කුඩා වීම. 6. නවීන තාක්ෂණය භාවිතය අඩුවීම. 7. කළමනාකරණය ස්වාධීන වීම. 8. කේවල ස්වාමි ව්‍යාපාරයක් ලෙස බොහෝවිට සංවිධානය වීම. 9. වෙළෙඳපොළ බොහෝ විට දේශීය වීම. (කරුණු දෙකකට ලකුණු භාගය බැගින් කරුණු 8 ලකුණු 2)

(ආ) 1. ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම. 2. දේශීය සම්පත් භාවිතයට ගැනීම. 3. වැඩි රැකියා ප්‍රමාණයක් සැපයීම. 4. ප්‍රාදේශීය සංවර්ධනය ඇති වීම. 5. ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම. 6. නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම. 7. වෙළෙඳපොළ තරඟකාරීත්වය වර්ධනය කරගත හැකි වීම.
(කරුණු 4 කට ලකුණු භාගය බැගින් ලකුණු දෙකයි)

(v) (අ) මහා පරිමාණ කර්මාන්ත වල යෙදවුම් බොහෝවිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල නිමැවුම් වේ. එම යෙදවුම් අඛණ්ඩව සැපයීම තුළින් මහා පරිමාණ ව්‍යාපාරවල නිෂ්පාදන නොකඩවා පවත්වාගෙන යා හැකිවේ. එමෙන්ම සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාරිකයින්ට වෙළඳපොළක් නිර්මාණය වන අතර ඔවුන්ට ද අඛණ්ඩව තම නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා හැක. (ලකුණු 2)

(ආ) රාජ්‍ය අයතන : 1. කාර්මික තාක්ෂණ ආයතනය. 2. කාර්මික සංවර්ධන මන්ඩලය. 3. අපනයන සංවර්ධන මණ්ඩලය. 4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ලකුණු එකයි)

රාජ්‍ය නොවන ආයතන : 1. පෞද්ගලික බැංකු හා මුල්‍ය ආයතන 2. ජයිකා සංවිධානය 3. සර්වෝදය 4. සණස (ලකුණු 1)

08. (i) 1. සුවන. 2. සමුපකාර ග්‍රාමීය බැංකු ණය. 3. සණස ණය ව්‍යාපෘතිය. 4. සමෘද්ධි/දිවිනැගුමප සංවර්ධන ණය යෝජනා ක්‍රමය. 5. ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය.
(අදාල කාලීන ව්‍යාපෘති හතරක් නම් කිරීමට ලකුණු එකයි, නම් කර පැහැදිලි කිරීමට ලකුණු දෙකයි)

(ii) (අ) අන්තර්ජාලය ඔස්සේ ගනුදෙනු කරුවන්ට බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස්‍ය අංක භාවිතාකර ස්වයංක්‍රීයව තම බැංකු පහසුකම් ලබාගැනීමේ හැකියාව ඇතිකිරීම අන්තර්ජාල බැංකුකරණය ලෙස හැඳින්වේ. මෙය විද්‍යුත් බැංකුකරණය, ගෘහස්ථ බැංකුකරණය, මංගත බැංකුකරණය යනාදී නම්වලින්ද හැඳින්වේ. (ලකුණු දෙකයි)

(ආ) 1. විද්‍යුත් ව්‍යාපාර බිහිවීම. 2. බැංකු අතර දැඩි තරඟකාරිත්වය. 3. තාක්ෂණික දියුණුව. 4. ගනුදෙනුකරුවන්ගේකාර්ය බහුලත්වය. 5. විදේශ ගනුදෙනු වැඩිවීම හා ගෝලීයකරණය.
(කරුණකට ලකුණු භාගය බැගින් කරුණු 4ට ලකුනු 2)

(iii) (උ) 1. බැංකු පොළී අනුපාතය වෙනස් කිරීම. 2. ව්චල්‍ය සංචිත අනුපාතය වෙනස් කිරීම. 3. විවට වෙළඳපොළකටයුතු. 4. වාණිජ බැංකු අධීක්ෂණය කිරීම. (ලකුණු භාගය බැගින් කරුණු 4ට ලකුණු 2)

(ආ) වෙළඳ ආයතන ගනුදෙනුකරුවන්ට ලබාදී ඇති වෙළඳ ණය අයකිරීම සහ මිලදී ගැනීම සිදුකරනුලබන ආයතනය (ලකුණු 2)

(iv) (අ) 1. විශේෂිත කල්බදු මුල්‍යකරණ සමාගම්. 2. ප්‍රාථමික අලෙවිකරුවන්. 3. කොටස් තැරැව්කරුවන්. 4. ඒකක භාර 5. වෙළඳපොළ අතරමැදියන්. 6. ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්. (කරුණකට ලකුණු භාගය බැගින් කරුණු 4ට ලකුණු 2)

(ආ) 1. පොදු පිළිගැනීමක් තිබීම. 2. කල්පැවැත්මත් තිබීම. 3. අනුකරණයේ දුෂ්කරතාවය. 4.පහසුවෙන් ගෙන යා හැකිවීම. 5. සමජාතීය වීම. 6. කුඩා කොටස්වලට බෙදියහැකි වීම.
(කරුණකට ලකුණු භාගය බැගින් කරුණු 4ට ලකුණු 2)

(v) (අ) 1. ATM යන්ත්‍ර. 2. ADM යන්ත්‍ර. 3. CDM යන්ත්‍ර
4. ටෙලි බැංකු පහසුකම් 5. අන්තර්ජාල බැංකු කටයුතු
6. ටෙලිවිෂන් බැංකු පහසුකම්. (කරුණු 4ට ලකුණු 2)

(ආ) 1. ඒකක භාරකරු.
2. අරමුදල් කළමණාකරණ සමාගම.
3. ඒකක හිමිවන් හෙවත් ආයෝජකයින්.
(කරුණු 3කට ලකුණු 2, 1ක් හෝ 2ක් නම් ලකුණු 1)